මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டை வீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

කාර්යාලය / காரியாலயம் / Office - 081-2213097
ලේකම් / செயலாளர் / Secretary - 081-2213096
වට්ස් ඇප් අංකය / வட்ஸ்அப் இல. / Whatsapp No - 070-7213097
ෆැක්ස් / பெக்ஸ் / Fax - 081-2213082

මගේ අංකය / எனது இல / My No. CPC/PSC/40/18/2027
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2026.09. 29

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සහා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය / කළමනාකරණ සේවා නිලධාරී සේවය සහ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2027**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණිය, කළමනාකරණ සේවා නිලධාරී සේවය සහ කාර්යාල සේවක සේවය යන සේවාවන්ට අදාළ 2027 වසරේ වාර්ෂික ස්ථාන මාරුවීම් 2027.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇත.

02. අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති ඉහත සේවාවන්ට අදාළ නිලධාරීන්ගේ 2027 වසරේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු නියෝග සහිත ලේඛනය භාගත කරගන්නා ලෙස මෙයින් දන්වන අතර, ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් නව සේවා ස්ථානයේ 2027.01.01 දින රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි මුදාහැරිය යුතු බවද කාරුණිකව දන්වමි.

03. එසේම, පෙර වර්ෂ වල වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ මේ දක්වා නව සේවා ස්ථාන වෙත මුදා හැර නොමැති කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියේ නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන් හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සිටී නම් එම නිලධාරීන් ස්ථාන මාරු ලද සේවා ස්ථාන වෙත මුදාහරින ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.

04. තවද, වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව ඔබ කාර්යාලය යටතේ ඇති උප කාර්යාල සහ වෙනත් සේවා ස්ථාන වෙත අනුයුක්ත කර ඇති සියළුම නිලධාරීන් ද දැනුවත් කරන ලෙස සහ ඒ පිළිබඳ අභියාචනා ඇත්නම් අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති පහත සඳහන් අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පතේ ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියා මඟින් පමණක් 2026.10.31 දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතු අතර, එදිනට පසුව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් සලකා බැලීමක් සිදු නොකරන බවද, වැඩිදුරටත් සඳහන් කරමි.

| | |
|---|---|
| ම.ප./වා.ස්.මා./SUP-02 | මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත |

කාරු. අ.පි.බ



CamScanner

| | |
|---|---|
| ම.ප./වා.ස්.මා./MSO-02 | මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත |
| ම.ප./වා.ස්.මා./KKS-02 | මධ්‍යම පළාත් කාර්යාල සේවක සේවයේ යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත |

05. අභියාචනා තීරණයන්ට පසු අවසන් ස්ථාන මාරු නියෝග අනුව **2027.01.01** දින සිට වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග ක්‍රියාත්මක සියළුම නිලධාරින් **2026.12.31** දින සේවයෙන් පසු නව සේවා ස්ථාන වෙත අනිවාර්යයෙන් මුදාහැරිය යුතු බව මෙයින් කාරුණිකව දන්වමි.

කේ.කේ.පී.අයි.ඩී.පී.විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත :

1. විගණකාධිපති - අ.ක.ස.



CamScanner